# ගණිතය

## පළමුවන ශ්‍රේණිය

### තුන්වන වාරය

<u>ගුරු මාර්ගෝපදේශයට අනුව සම්පාදිතයි</u>

**සැකසුම : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**



# ද්‍රව්‍ය 20 ක් ගණන් කිරීම





- රබර් ඇට 20ක්
- ඇට වර්ගයකින් 20ක්
- වියළි කොස් කොළ 20 ක්
- පෙට්ටි 1

**ක්‍රියාකාරකම – 1**

**දෙමාපියන්ට උපදෙස්-**

- ඉහත එක් වර්ගයකින් ද්‍රව්‍ය 10 ක් පෙට්ටියට දමන්න.
- එම ද්‍රව්‍ය මේසය මත , පේළියට තබන්න.
- මේසය මත තැබූ ද්‍රව්‍ය එකින් එකට ඇඟිල්ල තබමින් 1 සිට 10 තෙක් අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවාට කියන්න .
- කිහිප වරක් 1 සිට 10 දක්වා අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවා යොමු කරන්න.
- ද්‍රව්‍ය 10 ක් පෙට්ටියට දමන්න.
- 1 සිට 10 තෙක් ඇති ඕනෑම සංඛ්‍යාවක් පවසන්න.
- පැවසූ සංඛ්‍යාවට සමාන ද්‍රව්‍ය ගණනක් ,එකින් එක ගණන් කරමින් පෙට්ටියෙන්, ඉවතට ගෙන මේසය මත පේළියට තැබීමට දරුවාට කියන්න
- මේසය මත තැබූ ද්‍රව්‍ය එකින් එකට ඇඟිල්ල තබමින් නැවතත් අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවාට කියන්න
- සංඛ්‍යා වෙනස් කරමින් කිහිප වරක් පවසන්න .
- ද්‍රව්‍ය එකින් එකට ඇඟිල්ල තබමින් අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම– 2**

- ඉරටුවකට මල් 15ක් අමුණා ගන්න.
- එක් එක් මලට ඇඟිල්ල තබමින් 1 සිට 10 තෙක් අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

- ගණන් කළ ස්ථානය තෙක් මල් " කීය ද " යි දරුවාගෙන් විමසන්න.
- 10 ට පසු තව එක මලක් පෙන්වමින් එකොළහ යැයි කිහිප වරක් පවසන්න.
- තව මලක් පෙන්වමින් දොළහ යැයි කිහිප වරක් පවසන්න.
- මෙසේ දහතුන, දහහතර, පහළොව තෙක් කිහිප වරක් පවසමින් ගණන් කරන්න.
- නැවත දරුවා සමඟ එකොළහ, දොළහ , දහතුන, දහහතර, පහළොව තෙක් ගණන් කරන්න.
- අමුණන ලද මල් එකින් එකට ඇඟිල්ල තබමින් 1සිට 15 තෙක් අනුපිළිවෙළින් කිහිප වරක් ගණන් කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.
- පහත කොටුව තුළ කුඩා බෝල 15 ක් ඇඳ ඒවා පාට කිරීමට දරුවාට කියන්න.

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |

- අඳින ලද බෝල එකින් එකට ඇඟිල්ල තබමින් 1 සිට 15 තෙක් අනුපිළිවෙළින් කිහිප වරක් ගණන් කිරීමට දරුවාට කියන්න.

**ක්‍රියාකාරකම - 4**

- වියළි කොස් කොළ 20 ක් පෙට්ටියකට දමන්න.
- වරකට එක කොස් කොළය බැගින් ගෙන 1 සිට තෙක් 15 ගණන් කරමින් මේසය මත තබන්න යැයි දරුවාට පවසන්න .
- මේසය මත තැබූ "කොස් කොළ ගණන කීය ද " යි දරුවාගෙන් විමසා පිළිතුර ලබාගන්න.
- පෙට්ටියෙන් තව එක කොස් කොළයක් ගෙන මේසය මත තබා දහසය යැයි කිහිප වරක් පවසන්න.

- පෙට්ටියෙන් තව එක කොළයක් ගෙන මේසය මත තබා දහහත යැයි කිහිපවරක් පවසන්න.
- දහඅට, දහනවය විස්ස තෙක් ,පෙර පරිදිම කොස් කොළය බැගින් තබමින් ගණන් කරන්න.
- දරුවා සමග 16 සිට 20 තෙක් නැවත කිහිප වරක් ගණන් කරන්න.
- මේසය මත කොස් කොළ 20 ක් පේළියට තබන්න.
- කොස් කොළ එකින් එකට ඇඟිල්ල තබමින් 1 සිට 20 තෙක් කිහිප වරක් අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවාට කියන්න.
- කොස් කොළ 20 එකින් එක ගණන් කරමින් ගෙන ,කොස් කොළ තොප්පියක් සෑදීමට දරුවාට උදව් කරන්න.

*1 ශ්‍රේණිය ගණිතය වැඩ පොතේ පිටු අංක 69, 70 ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ පෙන්වන්න.*